**උඩුදුම්බර ප්‍රාදේශීය සභාව - 2021**
**--------------------------------------**

1. මූල්‍ය ප්‍රකාශන
-------------------

1.1 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට උඩුදුම්බර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනයකරන පාර්ශවයන්ගේ වගකීම්
-------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) ප්‍රාදේශීය සභාවේ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විවිධ ණයහිමියන් 16 දෙනෙකුට අදාළ රු.44,652 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම සැකසීමේදී ණය හිමි ශේෂ ඇතුළත් කර ඉදිරිපත් කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | ස්ථාවර වත්කම් ලේඛනයේ දැක්වෙන රු.200,000 ක ගොඩනැගිල්ලක් පිහිටි ඉඩමේ අගය සහ වටිනාකම් සඳහන් නොකළ ඉඩම් 04 ක අගය තක්සේරුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | ඉදිරියේදී වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කරන බව දන්වා ඇත. | ස්ථාවර වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතුව පැවති ඉඩම් හා ගොඩනැගිලි 3 ක් පිළිබඳ විස්තර මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණද , ඒවායේ වටිනාකම් ගණනය කර දක්වා නොතිබුණි. | ඉදිරියේදී වටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කරන බව දන්වා ඇත. | වත්කම්වල වටිනාකම් ගණනය කර මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

1.7 අනුකූල නොවීම්

නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104 (4) වගන්තිය | 2020 ජූලි 18 දින අනතුරට ලක්වී තිබුණු සභාවට අයත් ඩ්‍රම් ට්‍රක් රථය සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් එම අනතුර සිදුවූ දින සිට තුන් මසක් ඇතුළත ඉදිරිපත් කළ යුතු වුවද, අනතුර සිදුවී මාස 06 කට ආසන්න කාලයක් ගතවී අදාළ පරීක්ෂණ මණ්ඩලය 2021 ජනවාරි 06 දින පත්කර තිබුණි. එමෙන්ම විගණන දිනය වූ 2022 ජනවාරි 03 දින වන විට වසරකට අධික කාලයක් ගත වුවද අදාළ වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ වාර්තාව කඩිනමින් ලබා දීමට කටයුතු කරන බව දන්වා ඇත. | මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,180,488 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,961,982 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් හිඟය රු.525,589 ක් වූ අතර ඒ තුළ වසර 1 සිට 5 අතර කාලපරාසයක් හා වසර 05 ට වැඩි කාලයක් ගත වී ඇති හිඟ වරිපනම් පිළිවෙලින් රු.223,556 ක් හා රු.30,213 ක් විය. හිඟ වරිපනම් අයකිරීම සම්බන්ධයෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | රු.411,300 ක හිඟ මුදල් ජංගම සේවා පවත්වා අයකරගැනීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ආ) කඩ කුලී

------------

| | | |
|---|---|---|
| සභාව සතු කඩ කාමර 15 ක් සඳහා 2018 මැයි 22 දිනැති රජයේ තක්සේරුවකට අනුව ගිවිසුම්ගත වී තිබුණද අදාළ කඩකුලී අය කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවිය යුතු මුළු කඩ කුලිය රු.2,444,655 ක් වු අතර මුළු කඩ කුලිය තුළ සමාලෝචිත වර්ෂයට අදාළ කඩ කුලී හිඟය රු.1,189,611 ක් හෙවත් මුළු හිඟයෙන් සියයට 48 ක් වැනි ඉහළ අගයන් ගෙන තිබුණි. | රු.1,685,705 ක මුදලක් අයකර ගැනීම සඳහා නඩු කටයුතු සිදුකරමින් පවතින අතර ඉතිරි හිඟය අයකර ගැනීම සඳහා කඩ කාමර හිමියන් දැනුවත් කර ඇත. | ගිවිසුම් ප්‍රකාරව කුලී අය කළ යුතුය. |

(ඇ) වෙනත් ආදායම්

--------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තු ශේෂය රු.872,154 ක් විය. ඒ තුළ උඩුදුම්බර දිසා රෝහලෙන් අයවිය යුතු හිඟ ජල ගාස්තුව රු.139,110 ක් වූ අතර, මුළු ජල ගාස්තු හිඟයෙන් වසර 1 සිට වසර 5 අතර හා වසර 5 ට වැඩි හිඟ ජල ගාස්තු පිළිවෙලින් රු.148,959 ක් සහ රු.155,940 ක් විය. | ගාස්තු අයකර ගැනීම සඳහා දැනුවත් කිරීම සිදුකර ඇති අතර සමත මණ්ඩලයේ නඩු දමා ඇත. | ගිවිසුම් අනුව හිඟ ගාස්තු අය කළ යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

3.1 අවිධිමත් ගනුදෙනු

-----------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | --------------------------- | --------------- |
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තියට අනුකූල නොවන ලෙසට බාහිර ආයතනවල මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර ඉටුකළ යුතු කර්මාන්ත 04 ක් වෙනුවෙන් ප්‍රාදේශීය සභා අරමුදලෙන් රු.1,807,305 ක් වැයකර තිබුණු අතර, එම මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි. | ගරු සභාපතිතුමාගේ උපදෙස් පරිදි එම මුදල් අත්තිකාරම් මුදල් ගෙවීමක් ලෙස සභා අරමුදලෙන් ගෙවන ලද අතර අදාළ මුදල් ප්‍රතිපූර්ණය කර ලැබුණු වහාම එම අත්තිකාරම් මුදල් පියවීමට කටයුතු කරන බව දන්වා ඇත. | ගෙවන ලද අත්තිකාරම් අය කළ යුතුය. |

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රු.2,124,170 ක නිෂ්කාර්යව පවතින වාහන 4 ක් අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ වෙන්දේසි කිරීමට කටයුතු නොකර සභාවට අයත් තිස්ස අත්තනායක ශාලා භූමියේ ගාල්කර තිබුණි. | අදාළ වාහන අලුත් වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කරන බව | අදාළ වාහන අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අලුත්වැඩියා කළ නොහැකි නම් අපහරණය කිරීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ආ) | 2015 හා 2019 වර්ෂවල ලැබී තිබුණු රු.30,010,323 ක වාහන 03 ක් විගණන දින වන 2022 මාර්තු 10 දින වන විට භාවිතයට නොගෙන සභාවේ සම්මන්ත්‍රණ ශාලා භූමියේ හා කසළ අංගනයේ ගාල් කර තිබුණි. | අදාළ රියදුරන් බඳවා ගත් පසු එම වාහන භාවිතයට ගන්නා බව. | අදාළ වාහන අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අලුත්වැඩියා කළ නොහැකි නම් අපහරණය කිරීමට හෝ කටයුතු කළ යුතුය. |